සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 13 - 2023**

විභාග අංකය: ....................................

## යුරෝපා ඉතිහාසය - I

කාලය පැය 03 යි විනාඩි 10 යි.

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එකක් පමණි.
- ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරා ගත් පසු එයට අදාළ අංකය දී ඇති උපදෙස් පරිදි වරහන් තුළ වූ තිත් ඉර මත ලකුණු කරන්න.
- මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු එම කොටස II කොටසේ පිළිතුරු පත්‍ර සමග අමුණා භාර දෙන්න.

---

- අංක 01 සිට 10 දක්වා වූ ප්‍රශ්නවල දී ඇති නම් පහෙන් එකක් නොගැලපේ. එම නොගැලපෙන වරණයට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.

01 (1) මර්මරා මුහුද (2) අසෝව් මුහුද (3) කැරිබියන් මුහුද
(4) ඊජියන් මුහුද (5) අද්‍රියාතික් මුහුද (........)

02 (1) ඇතැන්ස් (2) මිලේටස් (3) කොරින්ත්
(4) ඩෙල්ෆි (5) ඩයොක්ලීෂන් (........)

03 (1) ජුලියස් සීසර් (2) ඔගස්ටස් (3) කොන්ස්ටන්ටයින්
(4) ඩයොක්ලීෂන් (5) තියඩෝසියස් (........)

04 (1) බොලොඤ්ඤා (2) ඔක්ස්පර්ඩ් (3) කේම්බ්‍රිජ්
(4) පැරිස් (5) ලයිසියම් (........)

05 (1) වර්ජිල් (2) තේලිස් (3) ටැසිටස්
(4) හොරේස් (5) ජුවෙනල් (........)

06 (1) සියුස් (2) හර්කියුලීස් (3) මාර්ස්
(4) ඇපලෝ (5) ප්‍රොසයිඩන් (........)

07 (1) ඔරේන්ජ් (2) ටියුඩර් (3) හැනෝවර්
(4) ස්ටුවර්ට් (5) බූර්බෝන් (........)

08 (1) කැස්ටීල් (2) ඇරගන් (3) සාර්ඩිනියා
(4) ග්‍රැනඩා (5) නවාරේ (........)

09 (1) බර්තොලයුමිඩයස් (2) ක්‍රිස්ටෝපර් කොලොම්බස් (3) ප්‍රැන්සිස් ක්ෂේවියර්
(4) ජෝන් කැබෝ (5) ජැක්විස් කාටියර් (........)

10 (1) ට්‍රැෆල්ගාර් සටන (2) ඔස්ටර්ලිට්ස් සටන (3) ජෙනා සටන
(4) ප්‍රීඩ්ලන්ඩ් සටන (5) මැජෙන්ටා සටන (........)

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්න වූ සඳහා පද යුගල පහ බැගින් දී ඇත. ඒවායින් එක යුගලයක ප්‍රකාශ එකිනෙකට නොගැලපේ. එම නොගැලපෙන යුගලය කුමක් දැයි හඳුනාගෙන ඊට ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

11 (1) සොක්‍රටීස් - සද්භාවය වූ කලී දැනුමයි
(2) හිපෝක්‍රටීස් - සෑම රෝගයකටම ස්වභාවික හේතුවක් ඇත.
(3) ප්ලේටෝ - පාලකයා දාර්ශනිකයකු විය යුතුය
(4) ඇරිස්ටෝටල් - මිනිසා දේශපාලන සත්ත්වයෙකි
(5) මැකියාවෙලි - මිනිසා නිදහස්ව උපත ලබයි (........)

12 (1) රෝමය - ටයිබර්
(2) ලන්ඩන් - තේම්ස්
(3) ලිස්බන් - ටාගුස්
(4) පැරිස් - සේන්
(5) මොස්කව් - රයින් (........)

13 (1) සියක් අවුරුදු යුද්ධය - එංගලන්තය හා ප්‍රංශය
(2) හත් අවුරුදු යුද්ධය - එංගලන්තය හා ප්‍රංශය
(3) ක්‍රිමියන් යුද්ධය - රුසියාව හා තුර්කිය
(4) රෝස යුද්ධය - ප්‍රංශය හා රුසියාව
(5) සත් සති යුද්ධය - ඔස්ට්‍රියාව හා ප්‍රශියාව (........)

14 (1) බූර්බෝන් - ප්‍රංශය
(2) හැප්ස්බර්ග් - ඔස්ට්‍රියාව
(3) රොමනොෆ් - රුසියාව
(4) ටියුඩර් - ප්‍රශියාව
(5) සැවෝයි - ඉතාලිය (........)

15 (1) කැම්පෝ ෆෝමියෝ ගිවිසුම - නැපෝලියන් සහ ඔස්ට්‍රියාව
(2) ප්‍රෙස්බර්ග් ගිවිසුම - නැපෝලියන් සහ ඔස්ට්‍රියාව
(3) ටිල්සිට් ගිවිසුම - නැපෝලියන් සහ රුසියාව
(4) කොන්කෝඩට් ගිවිසුම - නැපෝලියන් සහ හත්වන පියුස්
(5) ලූනෙවිල් ගිවිසුම - නැපෝලියන් සහ ස්පාඤ්ඤය (........)

- **අංක 16 - 20 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති X හා Y තීරුව සමග ගැළපෙන අනුපිළිවෙලට සකස්කල විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් අංකය වරහන් තුළ ලියන්න.**

16

| | X | | Y |
|---|---|---|---|
| 1. | ජුපිටර් | A | යුද්ධයට අධිපති |
| 2. | මාර්ස් | B | මුහුදට අධිපති |
| 3. | වීනස් | C | අහසට අධිපති |
| 4. | නෙප්චූන් | D | අත්කම්වලට අධිපති |
| 5. | මිනර්වා | E | ආලයට අධිපති |

(1) CADEB (2) CABED (3) CAEBD
(4) DCEAB (5) DAECB (........)

17

| | X | | Y |
|---|---|---|---|
| 1. | බොට්ෂෙලි | A | අටවන හෙන්රි |
| 2. | මයිකල් ආංජිලෝ | B | කොන්ස්ටන්ටයින් අධිරාජයා |
| 3. | ලෙනාර්ඩෝ ඩාවින්සි | C | හත්වන හෙන්රි |
| 4. | රෆායල් | D | මෙටර්නික් |
| 5. | ටිටියන් | E | හතරවන හෙන්රි |

(1) BDAEC (2) BDEAC (3) BCAED
(4) DEABC (5) CDABE (........)

| | X | | Y |
|---|---|---|---|
| 18 | 1. මිලාන් ආඥාව | A | අටවන හෙන්රි |
| | 2. සේවා නීතිය | B | කාන්ස්ටන්ටයින් අධිරාජයා |
| | 3. ආධිපත්‍ය පනත | C | හත්වන හෙන්රි |
| | 4. නැන්ටීස් ආඥාව | D | මෙටර්නික් |
| | 5. කාල්ස්බාඩ් ආඥාව | E | හතරවන හෙන්රි |

(1) BCAED (2) BCEAD (3) BCDEA
(4) CDAEB (5) CDEAB (........)

| | X | | Y |
|---|---|---|---|
| 19 | 1. උත්කෘෂ්ට විප්ලවය | A | මානව හිමිකම් ප්‍රකාශනය එළි දැක්වීම |
| | 2. ඇමෙරිකන් විප්ලවය | B | ලිබරල්වාදී ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය |
| | 3. ප්‍රංශ විප්ලවය | C | පෞද්ගලික දේපළ අයිතිය අහෝසි වීම |
| | 4. 1848 විප්ලවය | D | රජු අභිබවා පාර්ලිමේන්තුව ජයග්‍රහණය කිරීම |
| | 5. රුසියන් විප්ලවය | E | ලොව ප්‍රථම ජනාධිපති ආණ්ඩුක්‍රමය බිහි වීම |

(1) DEBCA (2) DEABC (3) DEABC
(4) BCAED (5) BCEDA (........)

| | X | | Y |
|---|---|---|---|
| 20 | 1. වී අයි ලෙනින් | A | මහාද්වීපික හමුදාව |
| | 2. ඇඩෝල්ෆ් හිට්ලර් | B | රතු කමීස හමුදාව |
| | 3. බෙනිටෝ මුසෝලිනි | C | රතු හමුදාව |
| | 4. ජෝර්ජ් වොෂිංටන් | D | දුඹුරු කමීස හමුදාව |
| | 5. ගැරිබෝල්ඩි | E | කළු කමීස හමුදාව |

(1) CDAEB (2) CDEAB (3) DEACB
(4) CDEBA (5) CABED (........)

- **21 සිට 25 තෙක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21 පුනරුදය
(1) පුනරුදය ඉතාලියෙන් ආරම්භ විය
(2) ඉතාලියෙන් ආරම්භ වී ක්‍රමයෙන් යුරෝපයේ වෙනත් රටවලට ද ව්‍යාප්ත විය.
(3) පුනරුද සමයේ සමාජයේ දෘෂ්ඨිය මානවවාදය කේන්ද්‍ර කරගෙන ගොඩ නැගිනි.
(4) පුනරුදය නූතන යූරෝපයේ හැරවුම් ලක්ෂය විය.
(5) ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ ප්‍රධාන ප්‍රතිඵලය විය. (........)

22 ජාතික රාජ්‍ය බිහි වීමේ පසුබිම
(1) නැගී ආ මධ්‍යම පන්තියේ ක්‍රියාකාරීත්වය
(2) මැකියාවෙලි ජීන් බෝඩන් වැනි දාර්ශනිකයන්ගේ මතවාද
(3) ක්‍රිස්තු සභාවේ ආධිපත්‍ය වර්ධනය වීම
(4) රජවරු යටතේ රාජ්‍ය හමුදාවේ වර්ධනය
(5) වාණිජවාදය (........)

23 කාර්මික විප්ලවය එංගලන්තයෙන් ආරම්භ වීම
(1) එංගලන්තය තුළ වැඩවසම් ක්‍රමය බිඳ වැටී තිබීම
(2) මානව හිතවාදී පාප් වහන්සේලාගේ මධ්‍යස්ථ ප්‍රතිපත්ති
(3) දේශපාලන ස්ථාවරභාවය
(4) සම්පත් පුද්ගලයින් හා අනුග්‍රහක ධනවත් ව්‍යවසායක පන්තියක් සිටීම
(5) ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය නිසා රැකියා සොයා ග්‍රාමීය ජනතාව නගර කරා ඇදී ඒම (........)

24 ජාතීන්ගේ සංගමය
(1) දෙවන ලෝක යුද්ධයෙන් පසුව පිහිටුවන ලදී.
(2) පැරිස් සාම ගිවිසුමේ පළමුවන පරිච්ඡේදය තුළින් නීතිගත විය
(3) ජාතීන් අතර ඇති වන මතභේද සාමකාමීව සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීම ප්‍රධාන අරමුණ විය.
(4) ඇමෙරිකානු ජනාධිපති වුඩ්රෝ විල්සන්ගේ කරුණු 14 ලියවිල්ල පදනම් කරගෙන ව්‍යවස්ථාව සකස් විය.
(5) මූලස්ථානය ජිනීවා නුවර පිහිටුවන ලදී. (........)

25 ෆැසිස්ට්වාදය
(1) පළමුවෙනි ලෝක යුද්ධයෙන් පසුව ඇති වූ ආර්ථික අර්බුදය නිසා නිර්මාණය වූ සමාජ කැළඹීම පදනම් කරගෙන ගොඩනැගුණි.
(2) ප්‍රජාතන්ත්‍රවාදය, ලිබරල්වාදය හා කොමියුනිස්ට්වාදය යන දේශපාලන සංකල්පවලට ප්‍රතිවිරුද්ධව ගොඩනැගුණු මතවාදයකි.
(3) රාජ්‍ය හා එහි අධිකාරි බලයට සියලු පුද්ගලයන් යටත් විය යුතු බව දැඩිව විශ්වාස කරයි.
(4) ඉතාලියේ මුසෝලිනි විසින් අනුගමනය කළ දේශපාලන දර්ශනය විය.
(5) සමාජ සමානාත්මතාවයට ගරු කරයි. (........)

- **ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (A), (B), (C), (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,**
**A හා B පමණක් නිවැරදි නම් 1 B හා C පමණක් නිවැරදි නම් 2**
**C හා D පමණක් නිවැරදි නම් 3 A හා C පමණක් නිවැරදි නම් 4**
**වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංඛ්‍යාවක හෝ නිවැරදි නම් .................... 5 ද ලියන්න.**

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| **A සහ B පමණක් නිවැරදි ය.** | **B සහ C පමණක් නිවැරදි ය.** | **C සහ D පමණක් නිවැරදි ය.** | **A සහ C පමණක් නිවැරදි ය.** | **වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය.** |

26 නව අධිරාජ්‍යවාදය සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදිවේද?
(A) කාර්මික විප්ලවය නව අධිරාජ්‍යවාදය ඇති වීමට මඟ පෑදීය
(B) නව අධිරාජ්‍යවාදයේ ප්‍රතිඵලයක් ලෙස අප්‍රිකා මහාද්වීපය යුරෝපා බලවතුන් අතර බෙදී කැබලි වී ගියේ ය.
(C) ජාතික රාජ්‍ය පාලකයින්ගේ වාණිජවාදී ආර්ථික ප්‍රතිපත්තිය යටත් විජිත අත්පත් කර ගැනීමට මාර්ගය පෑදීය.
(D) අමුද්‍රව්‍ය සහ වෙළඳපොළ අත්පත් කර ගැනීමේ තරඟය නව අධිරාජ්‍යවාදයට හේතු විය. (........)

27 බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදිවේද?
(A) මධ්‍යතන යුගයේ රජුගේ කැමැත්ත පරිදි රැස් කළ වංශාධිපතිවරුන්ගෙන් සමන්විත වූ මහසභාව පාර්ලිමේන්තු ක්‍රමයේ ආරම්භක අවස්ථාව ලෙස සැලකීම.
(B) තුන්වන ජෝන් රජුගේ කාලයේ දී 1215 මහා ප්‍රඥප්තිය (මැග්නාකාර්ටා ගිවිසුම) අත්සන් කිරීම තුළින් පාර්ලිමේන්තුව ශක්තිමත් වීම
(C) ස්ටුවට් රාජ්‍යවංශ යුගය රජු හා පාර්ලිමේන්තුව අතර සාමකාමී යුගයක් විය.
(D) පළමුවෙනි චාල්ස් රජුගේ කාලයේ දී පාර්ලිමේන්තුව තුළ දේශපාලන කණ්ඩායම් බිහි වීම (........)

28 ඉතාලි එක්සත් ව්‍යාපාරය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදිවේද?
(A) පීඩ්මොන්ට් සාර්ඩිනියා රාජ්‍යය ඉතාලි එක්සත් ව්‍යාපාරයේ නායකත්වය ගැනීම
(B) ජෝෂප් මැසිනි පීඩ්මොන්ට් සාඩිනියා රාජ්‍යයේ අගමැති තනතුරට පත් වීම
(C) ගැරිබෝල්ඩ් විසින් දකුණු ඉතාලි ප්‍රදේශ නිදහස් කර ගනු ලැබීම
(D) එක්සත් ඉතාලියේ පළමු රජු ලෙස චාල්ස් ඇල්බට් 1861 දී කිරුළ පැළඳීම (........)

29 පළමුවන ලෝක යුද්ධය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදිවේද?
(A) යුරෝපයේ ප්‍රධාන රටවල් බල කඳවුරු දෙකකට බෙදී යෑම
(B) ජර්මනිය විසින් පෝලන්තය ආක්‍රමණය කිරීම
(C) මිත්‍ර පිළ ලැබූ ජයග්‍රහණයට ඇමෙරිකානු එක්සත් ජනපදය ප්‍රධාන හේතුවක් විය.
(D) ජපානයේ අධිරාජ්‍යවාදී පිළිවෙත (........)

30 නිරවි යුද්ධය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදිවේද?
(A) පළමුවන ලෝක යුද්ධයෙන් පසුව ඇමෙරිකානු ජනාධිපති ඉදිරිපත් කළ කරුණු 14 ලියවිල්ල නිරවි යුද්ධයේ ආරම්භය ලෙස සැලකේ.
(B) සෝවියට් දේශය සහ චීනය අතර ඇති වූ මතවාදීමය අරගලය නිරවි යුද්ධය ආසියාවට ව්‍යාප්ත වීමට හේතු විය.
(C) ඇමෙරිකා එක්සත් ජනපදය යටතේ බටහිර බලවතුන් හා සෝවියට් දේශය ප්‍රධාන කොටගත් නැගෙනහිර යුරෝපා රටවල් අතර පැවති රාජ්‍යතාන්ත්‍රික ගැටුම නිරවි යුධ සමයේ දක්නට ලැබේ.
(D) ඇමෙරිකා එක්සත් ජනපදය මූලික කරගෙන උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය ද සෝවියට් දේශයේ නායකත්වය යටතේ වෝර්සෝ සංවිධානය ද නිරවි යුද්ධයේ පාර්ශවකරුවන් වූහ. (......)

- **අංක 31 - 35 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31 ඇතීනියානු ප්‍රජාතන්ත්‍රවාදයේ පියා ලෙස සැලකෙන්නේ කවුද?
(1) පෙරික්ලීස් (2) ඩ්‍රැකෝ
(3) ක්ලයිතීනිස් (4) සොලෝන්
(5) ලයිසගුස් (........)

32 ''රජය නම් මමයි'' යන ඓතිහාසික ප්‍රකාශය සිදු කළ ප්‍රංශ පාලකයා කවුද?
(1) 4 වන හෙන්රි (2) 13 වන ලුවී
(3) 14 වන ලුවී (4) 15 වන ලුවී
(5) 16 වන ලුවී (........)

33 1648 පාර්ලිමේන්තුව හා රජු අතර ඇති වූ සිවිල් යුද්ධයට නායකත්වය දුන්නේ කවුරුන් විසින්ද?
(1) සයිමන් ඩී මොන්ට්පර්ඩ් (2) ඔලිවර් ක්‍රොම්වෙල්
(3) ප්‍රැන්සිස් බේකන් (4) හත්වන හෙන්රි
(5) පළමුවන ජේම්ස් (........)

34 ඇබිසිනියාව ආක්‍රමණය කිරීමෙන් අන්තර්ජාතික සම්මුතිය කඩකළ රට කුමක් ද?
(1) චීනය (2) ජපානය
(3) බ්‍රිතාන්‍ය (4) ඉතාලිය
(5) ප්‍රංශය (........)

35 ගිලාස්සොස්ට් සහ පෙරස්ට්‍රොයිකා ප්‍රතිසංස්කරණ රුසියාවට හඳුන්වා දුන් රුසියානු පාලකයා කවුද?
(1) වී. අයි. ලෙනින් (2) ජෝෂප් ස්ටාලින්
(3) නිකිතා කෘෂෙව් (4) යූරි අන්ද්‍රොපොව්
(5) මිහායිල් ගොර්බචොෆ් (........)

- **අංක 36-40 දක්වා වූ එක් එක් ප්‍රශ්න සඳහා වගන්ති දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති වගන්ති යුගලයට වඩාත් ම හොඳින් ගැලපෙනුයේ කුමන විග්‍රහය දැයි පහත සඳහන් වගුව පදනම් කොටගෙන තෝරා අදාළ අංකය වරහන් තුළ ලියන්න.**

| | පළමු ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදිය | වැරදිය |
| 2 | නිවැරදිය | නිවැරදිය |
| 3 | වැරදිය | වැරදිය |
| 4 | වැරදිය | නිවැරදිය |
| 5 | නිවැරදිය | නිවැරදිවන අතර පළමු ප්‍රකාශය මැනවින් පහදා දෙයි |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | පිළිතුරු |
|---|---|---|---|
| 36 | ටැසිටස් හා ජුවෙනල් පුරාණ රෝමයේ සිටි ලතින් සාහිත්‍ය පෝෂණය කළ ලේඛකයෝ දෙදෙනෙක් වූහ. | තියඩෝසියස් අධිරාජයාගේ පාලන සමයේ දී ක්‍රිස්තු ධර්මය රෝම අධිරාජ්‍යයේ රාජ්‍ය ආගම බවට පත් විය. | (.............) |
| 37 | පෘතුගීසි දේශ ගවේෂණවලට අනුග්‍රහය ලබා දුන්නේ ප්‍රෙස්ටර් ජෝන් විසිනි. | ස්පාඤ්ඤය ජාතික රාජ්‍යයක් ලෙස ගොඩ නැගීමට පදනම දමනු ලැබුවේ පර්ඩිනන්ඩ් / ඉසබලා යුවල විසිනි | (.............) |
| 38 | බොස්ටන් තේ සාදය හේතු කොටගෙන ප්‍රංශ විප්ලවය ආරම්භ විය. | 1789 දී ජෝර්ජියාවේ දී ප්‍රථම මහා ද්විපික සම්මේලනය කැඳවා ඇමෙරිකානු ජනපදවල ස්වාධීනත්වය ප්‍රකාශයට පත් කරන ලදී. | (.............) |
| 39 | ආදි තන්ත්‍රය යටතේ ඉහළම තනතුරු හෙබ වූ රදළ පන්තියේ ආධිපත්‍ය ප්‍රංශ විප්ලවය විසින් නිම කරන ලදී. | ප්‍රංශ විප්ලව සමයේ දී වැඩවසම් රදළ අයිතිවාසිකම් අහෝසි කිරීමත් ඉඩම් රාජ සන්තක කිරීමත් නිසා එතෙක් සමාජයේ ඉහළම වරප්‍රසාද හිමි කරගෙන සිටි ප්‍රභූ රදළ පන්තිය සාමාන්‍ය පුරවැසියන් බවට පත් වූහ. | (.............) |
| 40 | 1939 සැප්තැම්බර් 01 (පළමු වැනිදා) දින හිට්ලර් විසින් පෝලන්තය ආක්‍රමණය කරනු ලැබීම මුල් කරගෙන දෙවන ලෝක යුද්ධය ආරම්භ විය. | II දෙවන ලෝක යුද්ධයෙන් පසුව මහා බ්‍රිතාන්‍යයේ ආධිපත්‍ය මුල් කරගෙන ධනවාදි කඳවුරේ වර්ධනය සිදු විය. | (.............) |

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

**තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023**

**Third Term Test - Grade 13 - 2023**

විභාග අංකය: ....................................

# යුරෝපා ඉතිහාසය - II

- **A** කොටසට පිළිතුරු ලිවීම අනිවාර්ය වේ. **B** හා **C** කොටස්වලින් ප්‍රශ්නයක් බැගින් වත් තෝරාගෙන ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 4 කි.

## A කොටස

01. ඔබට සපයා ඇති සිතියමේ පහත ස්ථාන ලකුණු කොට නම් කරන්න.

(1) සාර්ඩිනියාව (2) කළු මුහුද
(3) ඉංග්‍රීසි ඕඩය (4) ස්වීඩනය
(5) බෝල්ටික් මුහුද (6) සේන් ගඟ
(7) ලන්ඩන් (8) ටාගුස් ගඟ
(9) ඇපිනයින් කඳුවැටිය (10) බර්ලින්
(11) ඩාඩනල්ස් සමුද්‍ර සන්ධිය (12) ඩැන්සිග්

නිවැරිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි

## B කොටස

02 පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ පුරාණ රෝම සංස්කෘතියේ ලක්ෂණ පරීක්ෂා කරන්න.

(i) ආණ්ඩුක්‍රම
(ii) කලාව සහ සාහිත්‍යය
(iii) ගෘහ නිර්මාණ ශිල්පය (ල. 16)

03 ''ප්‍රොතෙස්තන්ත රෙපරමාදු ව්‍යාපාරය යුරෝපය වෙනස් කළ ආගමික විප්ලවය ලෙස හැඳින්විය හැකිය''

(i) ප්‍රොතෙස්තන්ත රෙපරමාදු ව්‍යාපාරය ආරම්භ කළ නායකයා නම් කරන්න. (ල. 1)
(ii) ප්‍රොතෙස්තන්ත රෙපරමාදු ව්‍යාපාරය ආරම්භ වූ රට නම් කරන්න. (ල. 1)
(iii) ප්‍රොතෙස්තන්ත රෙපරමාදු ව්‍යාපාරය ආරම්භ වීමට තුඩු දුන් ආගමික දේශපාලන හා ආර්ථික හේතු පරීක්ෂා කරන්න. (ල. 6)
(iv) ප්‍රොතෙස්තන්ත රෙපරමාදු ව්‍යාපාරයේ ප්‍රතිඵල ඇසුරෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විමසන්න. (ල. 8)

04 (i) කාර්මික විප්ලවලය මුලින්ම එංගලන්තයෙන් ආරම්භ වීමට තුඩු දුන් සාධක පරීක්ෂා කරන්න. (ල. 7)
(ii) කාර්මික විප්ලවයෙන් උද්ගත වූ ප්‍රතිඵල තත්කාලීනය යුරෝපා සමාජය තුළ ආර්ථික, දේශපාලන හා සමාජීය වශයෙන් සිදු කළ බලපෑම විග්‍රහ කරන්න. (ල. 9)

05 පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) කාදිනල් රිචලියුගේ කාර්යභාරය
(ii) තිස් අවුරුදු යුද්ධය
(iii) බ්‍රිතාන්‍යයේ දේශපාලන පක්ෂ ක්‍රමය
(iv) ඇමෙරිකන් නිදහස් සටනට බලපෑ හේතු (ල. 9)

## C කොටස

06 ''නැපෝලියන් බොනපාට් ප්‍රංශ විප්ලවයේ කාර්ය සංසිද්ධීන් රැසක් ඉදිරියට ගෙන ගියේ ය.''

(i) නැපෝලියන් බොනපාට්ගේ ජන්ම භූමිය නම් කරන්න. (ල. 1)

(ii) නැපෝලියන් බොනපාට් ප්‍රංශයේ අධිරාජ්‍යයා වීම දක්වා බලය අත්පත් කර ගත් ආකාරය පරීක්ෂා කරන්න. (ල. 6)

(iii) නැපෝලියන් බොනපාට් ප්‍රංශයේ අධිරාජයා වීම දක්වා බලය අත්පත් කර ගත් ආකාරය පරීක්ෂා කරන්න. (ල. 9)

07 (i) 1815 සිට 1848 දක්වා කාලය තුල ජර්මනිය එක්සත් කිරීමට තිබු බාධක විමසන්න. (ල. 7)

(ii) ඔටෝ වොන් බිස්මාර්ක් යටතේ ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ ප්‍රධාන අවස්ථා පරීක්ෂා කරන්න. (ල. 9)

08 දෙවන ලෝක යුද්ධය ආරම්භ වීමේ පසුබිම නිර්මාණය වන්නේ පළමුවන ලෝක යුද්ධයේ ප්‍රතිඵල තුළිනි'' සාකච්ඡා කරන්න. (ල. 16)

09. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහනක් ලියන්න.

(i) කවුන්ට කැවුවර්

(ii) බෝල්ෂෙවික් විප්ලවය


(iii) එක්සත් ජාතීන්ගේ සංගමයේ සාමසාධක ක්‍රියාවලිය.

(iv) නොබැඳි ජාතීන්ගේ ක්‍රියාවලිය.

(ල. 8 x 2)

- ප්‍රශ්න අංක 01 ට අදාළ යුරෝපා ආකෘති සිතියම.

# යුරෝපා සිතියම



සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය - 2023
## යුරෝපා ඉතිහාසය


13 ශ්‍රේණිය | පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 3 ) | 02. ( 4 ) | 03. ( 1 ) | 04. ( 5 ) | 05. ( 2 ) | 06. ( 3 ) | 07. ( 5 ) | 08. ( 3 ) | 09. ( 3 ) | 10. ( 5 ) |
| 11. ( 5 ) | 12. ( 5 ) | 13. ( 4 ) | 14. ( 4 ) | 15. ( 5 ) | 16. ( 3 ) | 17. ( 1 ) | 18. ( 4 ) | 19. ( 2 ) | 20. ( 4 ) |
| 21. ( 5 ) | 22. ( 3 ) | 23. ( 2 ) | 24. ( 1 ) | 25. ( 5 ) | 26. ( 5 ) | 27. ( 1 ) | 28. ( 1 ) | 29. ( 3 ) | 30. ( 4 ) |
| 31. ( 3 ) | 32. ( 3 ) | 33. ( 2 ) | 34. ( 4 ) | 35. ( 5 ) | 36. ( 2 ) | 37. ( 4 ) | 38. ( 3 ) | 39. ( 5 ) | 40. ( 1 ) |

## II කොටස

01




නිවැරදිව ලකුණු කිරීම හා නම් කිරීමට ලකුණු 01 බැගින් - 12

02.(i)පෞර රාජ්‍යයක් ලෙස ආරම්භ වීම

* එට්‍රුස්කන්වරු යටතේ රාජාණ්ඩු පාලනයක් පැවතීම
* ලතින්වරු විසින් එට්‍රුස්කන්වරු පලවා හැර සමූහාණ්ඩු පාලනය ගොඩනගා ගැනීම
* සමූහාණ්ඩුව තුළ සෙනෙට්සභාවට වැඩි වැදගත්කමක් හිමි වීම.
* රදළ ආධිපත්‍ය කැපී පෙනීම (පැට්‍රීසියන්වරු)
* කොන්සල්වරු දෙදෙනෙකුට රෝම සමූහාණ්ඩුව තුළ බලය හිමි වීම
* හදිසි අවස්ථාවක දී හයමසක කාලයක් සඳහා එක් කොන්සල්වරයකු බලය ලබා දීම.
* අසල්වැසි සීසර්ගේ අවදියේ රෝමය එංගලන්තය දක්වා ව්‍යාප්ත වීම
* ජස්ටීනියන් අධිරාජ්‍යයාගේ පාලන සමයේ දී රෝම නීති ක්‍රමය ආරම්භ වීම

(ii)
* සාහිත්‍ය කටයුතුවල දී ලතින් භාෂාව යොදා ගැනීම
* ඔගස්ටස් සීසර් අධිරාජ්‍යයාගේ පාලන සමය ස්වර්ණමය යුගය වීම
* සීසරෝ ප්‍රකට ලේඛකයෙක් හා දාර්ශනිකයෙක් වීම
* වර්ජිල්, හොරේස්, ලිවී, ඔිවිඩ් වැනි දක්ෂ ලේඛකයෝ සිටීම
* වර්ජිල්ගේ ඊනිඩ් උසස් සාහිත්‍ය කෘතියක් වීම, ඔහුගේ ජියෝජික්ස්, එක්ලෝගස් (කාව්‍ය සංග්‍රහය) එයිනේඩ්
* හොරේස්ගේ (odes, Epodes, satires, Epistles, Ars-poetica)
* ලවී ඉතිහාසය කතුවරයකු වීම, ඔහුගේ රෝම ඉතිහාසය නැමති කෘතිය

* මුල්ම පුවත්පත රෝමයෙන් හඳුන්වා දීම
* මාකස් අවුරේලියස් අධිරජ්‍යා ලේඛකයකු වීම
* මැටි බඳුන් කලාත්මකව නිම වීම
* නාට්‍යය කලාව
* චිත්‍රය ඇඳීම

(iii) * විශාල ගොඩනැගිලි ඉදිකිරීම
* ගෝලාකාර මුදුනේ ගෝලාකාර ශිඛර දක්නට ලැබීම
කොලෝසියම් ක්‍රීඩාගාරය, ඩයොක්ලීෂන් අධිරාජ්‍යයාගේ මාලිගය, බැසිලිකා නම් වාණිජ මධ්‍යස්ථානය
* මාර්ග තැනීමේ දී කොන්ක්‍රීට් ක්‍රමය භාවිත කිරීම (ල. 16)

03. i. මාටින් ලූතර් (ල. 01)

ii. ජර්මනිය (ල. 01)

iii. ආගමික හේතු
* කතෝලික සභාව දූෂිත ආයතනයක් විය.
* පාප් ධූරය සම්බන්ධයෙන් තිබූ ගෞරවය පිරිහී යෑම
* පාප් ධූරයට පත් වූවන් සම්බන්ධයෙන් පැවති අවිශ්වාසය
* කතෝලිත සභාව ලෞකිකත්වයට නැඹුරු වීම
* පාප් ධූරයට එකවර තිදෙනෙක් ඉදිරිපත් වීම

දේශපාලන
* යුරෝපයේ ජාතික රාජ්‍ය පාලකයින්ගේ නැගී ඒම
* ජාතික රාජ්‍ය පාලකයින් පාප් වහන්සේගේ ආධිපත්‍යයට විරුද්ධ වීම
* ශුද්ධ රෝම අධිරාජ්‍යය සහ ජර්මන් කුමාරවරු අතර තිබුණු ගැටුම්

ආර්ථික
* ක්‍රිස්තු සභාව සතු අසීමිත ධනය
* යුරෝපයේ කතෝලික රටවල්වලින් බදු රැස් කිරීම
* දේපළ තබා ගැනීම
* ජාතික රාජ්‍ය පාලකයෝ කතෝලික පල්ලියේ ආර්ථික ප්‍රතිපත්තියට විරුද්ධ වීම
* ආසන්නම හේතුව : ටෙට්සල්ගේ පුණ්‍ය ඵල පත්‍රිකා විකිණීම (ල. 06)

(iv) * මාටින් ලූතර් ආරම්භ කළ රෙපරමාදු ව්‍යාපාරය ව්‍යාප්ත වීම
* ජර්මන් කුමාරවරුන්ගේ සහාය හිමි වීම
* ශුද්ධ රෝම අධිරාජ්‍යයට අභියෝගයක් වීම
* කතෝලික සභාවේ ආධිපත්‍යයට විරුද්ධ ජාතික රාජ්‍ය පාලකයෝ ප්‍රෙතෙස්තන්ක ව්‍යාපාරයට සහාය දැක්වීම
* ක්‍රිස්තු සභාව දුර්වල වී දෙකඩ විය.
* යුරෝපයේ ආගමික ඒකාබද්ධතාව බිඳ වැටීම (ල. 08)

04. (i) * එංගලන්තයේ වැඩවසම් ක්‍රමය බිඳ වැටී තිබීම
* දේශපාලන ස්ථාවර භාවය
* මුදල් ආයෝජනය කළ හැකි ධනවතුන් සිටීම
* ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය නිසා ඉඩම් අහිමි ජනතාව නගර කරා ඇදීම ඒම නිසා නිදහස් ශ්‍රමිකයන් පිරිසක් බිහි වීම.
* කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය තිබීම
* යටත් විජිත ප්‍රතිපත්තිය (ල. 07)

(ii) ආර්ථික
* නිෂ්පාදන ක්‍රියාවලිය වේගවත් වීම
* නව තාක්ෂණය යොදා ගැනීම
* වෙළඳපොළ ආර්ථිකයක් බිහි වීම
* නිදහස් ශ්‍රමික පන්තිය කම්කරු පන්තිය
* කාර්මික ආර්ථිකයක් බිහි වීම

දේශපාලන
* නව යටත් විජිතවාදයට මඟ පෑදීම
* සමාජ ස්ථාවරය පුළුල් වීම
* මධ්‍යම පන්තියේ හා කම්කරු පන්තියේ බිහිවීම
* බ්‍රිතාන්‍ය දේශපාලන වැඩ සටහන් ව්‍යාප්ත වීම
* යටත් විජිත තුළ බ්‍රිතාන්‍ය ගැති කණ්ඩායම් බිහි වීම... දේශපාලන උද්ඝෝෂණ

සමාජීය
* මධ්‍යම පන්තියේ හා නිර්ධන පන්තියේ බිහි වීම
* දේශපාලන උද්ඝෝෂණ බිහි වීම
* නාගරීකරණය (ල. 09)

05. (i)
* කාදිනල් රිචලියුගේ කාර්යභාරය
* ප්‍රංශය ජාතික රාජ්‍යයක් කිරීමේ අරමුණ
* රාජාණ්ඩුව බලවත් කිරීම
* ප්‍රබල රදළයින් මර්දනය කිරීම
* තිස් අවුරුදු යුද්ධයේ දී ඔස්ට්‍රියාවේ හැප්ස්බර්ග් බලය බිඳ දැමීම
* හියුගනෝට්වරු මර්දනය කිරීම
* ප්‍රාදේශීය පාලනය ශක්තිමත් කිරීම
* ඉන්ටෙන්ඩාන්ට් නැමති නිලධාරීන් හරහා මධ්‍යම රජයට ප්‍රාදේශීය පාලනය ශක්තිමත් කිරීම
* එමඟින් රදළයින් දුර්වල කිරීම
* තිස් අවුරුදු යුද්ධයේ දී ශුද්ධ රෝම අධිරාජ්‍යයා දුර්වල කිරීමේ අරමුණින් ප්‍රොතොස්තවාදීන්ට උපකාර කිරීම (ල. 8)

(ii) තිස් අවුරුදු යුද්ධයට ආගමික, දේශපාලන හා ආර්ථික හේතු බලපෑම

ආගමික
* ඔග්ස්බර්ග් සමථයේ අඩු පාඩු
* එම අඩු පාඩු හේතු කොට ගෙන කතෝලික - ප්‍රොතෙස්තන්ත්‍ර ගැටුම් ඇති වීම
* කතෝලිකයන් යළි බලවත් වීම

දේශපාලන
* බොහීමියානු පැලෑයින් සිද්ධිය
* ශුද්ධ රෝම අධිරාජ්‍යයා සහ ජර්මන් කුමාරවරු අතර පැවති ගැටුම්
* ප්‍රංශ බූර්බෝන් සහ ඔස්ට්‍රියා හැප්ස්බර්ග් ගැටුම
* ජර්මනියේ ස්වාධීන පාලකයින් හා කැරලිකරුවන් අතර ගැටුම්

ආර්ථික
* ඩෙන්මාර්කයේ ආර්ථික අභිලාශයන්
* ජර්මන් කුමාරවරුන්ගේ ආර්ථික අභිලාශයන්
* ස්වීඩනයට බෝල්ටික් මුහුදේ ආධිපත්‍ය අවශ්‍ය වීම

(iii) බ්‍රිතාන්‍යයේ දේශපාලන පක්ෂ ක්‍රමය
* ස්ටුවර්ට් රාජවංශය හා පාර්ලිමේන්තුව අතර පැවති ගැටුම්
* එහි ප්‍රතිඵලයක් ලෙස එංගලන්ත පක්ෂ ක්‍රමය ආරම්භ වීම
* දෙවන චාර්ල්ස් රජුගේ කාලයේ දී ටෝරි හා විග් පක්ෂ දෙක ආරම්භ වීම
* ද්වී පක්ෂ ක්‍රමයේ ආරම්භය වීම
* 1832 න් පසු කොන්සර්වේටිව් සහ ලිබරල් පක්ෂ ලෙස වර්ධනය වීම
* 1900 දී කම්කරු පක්ෂය බිහි වීම
* 1906 මහා මැතිවරණය ප්‍රථම වරට කම්කරු පක්ෂ රාශියක් බිහි වීම

(iv) ඇමෙරිකන් නිදහස් සටනට බලපෑ හේතු
* එංගලන්තයේ යටත් විජිත ප්‍රතිපත්තිය
* උතුරු ඇමෙරිකානු ජනපද පාලනය
* ජනපදවලට දේශපාලන නිදහස හිමි වුවද ආර්ථික නිදහස හිමි නොවීම
* ජනපද ආර්ථික එංගලන්තයට වාසිදායක ලෙස පාලනය කිරීම
* අහිතකර බදු පැනවීම
* නිෂ්පාදන සීමා පැනවීම
* හමුදා බලය යෙදවීම
* ජනපදවල ආර්ථිකය සූරා කෑම
* අභිලනයෙන් සැලකිල්ලට නොගැනීම (ල. 8 x 2)

06. (i)
* කෝර්සිකාව (ල. 01)

(ii)
* ප්‍රංශ යුද හමුදාවට එක් වීම
* 1793 දී එංගලන්තයට පහර දී ටූලෝංවරාය නිදහස් කර ගැනීම
* ප්‍රංශය තුළ ජනප්‍රිය වීම
* 1795 දී පැරිස් නගරය තුළ නව ප්‍රංශ රජයට එරෙහිව කැරලි ඇති වීම
* නැපෝලියන් එම කැරලි මැඩලා ප්‍රංශ ආණ්ඩුවට විශ්වාසය එල කිරීම
* 1796 දී ඉතාලිය ආක්‍රමණය කිරීම

* අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වීම
* පස් දෙනෙකුගේ සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලය තිදෙනෙකු දක්වා අඩු කිරීම
* අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල අතට ගෙන ජනමත විචාරණයකින් බලය තහවුරු කර ගැනීම (ල. 06)

(iii)
* දේශීය ප්‍රතිපත්තිය
* ප්‍රංශය තුළ යම්තාක් දුරකට ප්‍රජාතන්ත්‍රවාදය ලබා දීම
* දක්ෂතා අනුව තනතුරුවලට පත් වීමට අවස්ථාව ලැබීම
* පරිපාලන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම
* ප්‍රිෆෙක්ට්වරු පත් කිරීම
* අධිරාජ්‍යයා යටතේ කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ පාසල පාලනය
* විශ්වවිද්‍යාල පාලනය කිරීම
* දර්ශනය, ඉතිහාසය, දේශපාලන විද්‍යාව ඉගැන්වීම තහනම් කිරීම
* විශ්විද්‍යාල පාලනය කිරීම
* ආගම රාජ්‍යයෙන් ඉවත් කිරීම
* නැපෝලියානු නීති සංග්‍රහය හඳුන්වා දීම
* පුවත්පත් පාලනය
* ඒකීය මුදල්, බැංකු ක්‍රම ඇති කිරීම
* බදු ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම

විදේශ ප්‍රතිපත්තිය
* ඔස්ට්‍රියාව සමඟ යුද්ධ කිරීම
* ඔස්ට්‍රියාව පරාජය කර කැම්පෝහෝමියෝ ගිවිසුම අත්සන් කිරීම
* ඔස්ට්‍රියාව සමඟ ලූනෙවිල් ගිවිසුම අත්සන් කිරීම
* 1802 දී එංගලන්තය සමඟ ඒමියන්ස් ගිවිසුම අත්සන් කිරීම
* බ්‍රිතාන්‍ය ප්‍රධාන සතුරා ලෙස සැලකීම
* ට්‍රැෆොල්ගාර් සටනින් බ්‍රිතාන්‍යයට පරාජය වීම
* රයින් සංයුක්තය පිහිටු වීම
* ජෙනා සටනින් ප්‍රශියාව පරාජය කිරීම
* රුසියාව පරාජය කර ටිල්සිට් ගිවිසුම අත්සන් කිරීම
* වෝර්සෝ ආදිපාද වසම නිර්මාණය කිරීම
* යටත් කර ගත් යුරෝපා රාජ්‍යවල රාජාණ්ඩු අහෝසි කර ඒවා පාලනයට තම ඥාතීන් පත් කිරීම (ල. 09)

07. (i)
* ජර්මන් රාජ්‍ය බෙදී පැවතීම
* රාජ්‍ය 39 ක් තිබීම
* ඔස්ට්‍රියානු චාන්සලර් මෙටර්නික්ගේ ක්‍රියා කලාපය
* වියානා සම්මේලනයේ තීරණ
* ලිබරල්වාදය මර්දනය වීම
* ජර්මන් රාජ්‍ය අතර පොදු වැඩ පිළිවෙලක් නොවීම (ල. 07)

(ii)
* ප්‍රශියාවේ චාන්සලර් තනතුරට පත් වීම
* ලිබරල්වාදීන් මර්දනය
* ලෝහ සහ යකඩ ප්‍රතිපත්තිය
* හමුදාව ශක්තිමත් කිරීම
* ඕස්ට්‍රියාවට එරෙහිව ප්‍රංශය හා ඉතාලිය සමඟ ගිවිසුම් ඇති කර ගැනීම
* උපක්‍රමශීලීව ඕස්ට්‍රියාව සමඟ එක්ව ඩෙන්මාර්කය පරාජය කර ෂ්ලෙස්විග් හා හොල්ස්ටයින් ලබා ගැනීම
* ඕස්ට්‍රියාව සමඟ යුද්ධය
* උතුරු ජර්මන් සංයුක්තය පිහිටු වීම
* ප්‍රංශය සමඟ යුධ වැදී ඇල්සාස් - ලොරේන් අල්ලා ගැනීම
* 1871 දී ජර්මනිය එක්සත් කිරීම (ල. 09)

08.
* පළමු ලෝක යුද්ධයෙන් පසුව වර්සායි ගිවිසුම අත්සන් කිරීම
* ජාතීන්ගේ සංගමය පිහිටුවීම
* ජර්මනියට දැඩි දඬුවම් පැමිණ වීම
* රුසියාවෙන් තොර යුරෝපය
* ජර්මනිය බංකොලොත් වීම
* ජාතීන්ගේ සංගමය අසාර්ථක වීම
* නාසිවාදයේ නැගී ඒම හා ජර්මනිය යළි යුදවාදී වීම (ල. 16)

09. (i) කවුන්ට් කැවූර්
* යළි ඉපදීම නැමති කෘතිය ලිවීම
* පීඩ්මොන්ට් රාජ්‍යයේ අගමැති තනතුරට පත් වීම
* ආර්ථික වශයෙන් බලවත් කිරීම
* ලිබරල්වාදීන්ගේ සහාය ලබා ගැනීම
* පීඩ්මොන්ට් රාජ්‍යය යටතේ ඉතාලි එක්සත් ව්‍යාපාරය සැලසුම් කිරීම
* ක්‍රිමියානු යුද්ධයට පීඩ්මොන්ට් සම්බන්ධ කිරීම
* ප්‍රංශය සහ බ්‍රිතාන්‍ය සමග ගිවිසුම ඇති කර ගැනීම
* ඔස්ට්‍රියාව පරාජය කිරීම
* ගැරිබෝල්ඩිගේ හමුදා ශක්තිය ලබා ගැනීම

(ii) බෝල්ෂෙවික් විප්ලවය
* ලෙනින්ගේ දායකත්වය
* කරෙන්ස්කිගේ ප්‍රතිසංස්කරණවාදී මෙන්ෂවික් පාලනය පෙරලා දැමීම
* ලොව ප්‍රථම සමාජවාදී විප්ලවය වීම
* 1917 ඔක්තෝම්බර් සාර් පාලනය හා කෙරෙන්ස්කිගේ සියලු පාලන කටයුතු අවසන් කිරීම
* ප්‍රථම සමාජවාදී රාජ්‍ය බිහි කිරීම

(iii) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාම සාධක ක්‍රියාවලිය
* නිරවි යුද සමයේ එක්ස්ත් ජාතීන්ගේ සංවිධානයේ ක්‍රියාකාරීත්වය වඩා වැදගත් වීම
* 1946 ඕලන්දයේ ඉන්දුනීසියා ගැටුම්
* පලස්තීන - ඊශ්‍රායල් - අරාබි ගැටුමට මැදිහත් වීම
* කොරියන් අර්බුදය විසඳීමට මැදිහත් වීම
* සුවස් අර්බුධය
* කොංගෝ අර්බුධය
* සයිප්‍රස් ප්‍රශ්නය විසඳීම
* ඉන්දියාවේ හා පාකිස්ථානයේ අර්බුදය
* කාෂ්මීර අර්බුධය
* ඇෆ්ගනිස්ථානයේ ගැටුම්

(iv)
* නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය
* දෙවන ලෝක යුද්ධයෙන් පසුව බිහි වීම
* ධනවාදී හෝ සමාජවාදී කඳවුරු දෙකින් එකකට හෝ ගැති නොවූ ස්වාධීන ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම
* නිදහස ලැබූ ආසියා හා අප්‍රිකා රටවල එකමුතුවක් වීම
* ඉන්දියානු අගමැති ජවහල්ලාල් නේරු, යුගෝස්ලාවියානු නායක මාර්ෂල් ටිටෝ, ඉන්දුනීසියානු නායක සුකර්නෝ, ඊජිප්තු ජනාධිපති අබ්දුල් ගමායල් නසාර්, ඝානාවේ ක්වාටේ න්කෘමා මූලික වීම
* පංචශීල ප්‍රතිපත්තිය අනුගමනය කිරීම
* බෙල්ග්‍රේඩ් ප්‍රකාශනය (ල. 8 x 2)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න